ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදනය අංක: HRC/P/i/S/28/10/26

මාධ්‍ය නිවේදනය

හෝමාගම පොලිස් නිලධාරීන්ගේ අත්අඩංගුවේදී 2026.10.25 වන දින හෝ ඊට ආසන්න දිනකදී මියගිය පුද්ගලයා පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණය

හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් පුද්ගයෙකු අත්අඩංගුවට ගෙන පහරදීම හේතුකොටගෙන මියගිය බවට මාධ්‍ය මඟින් ප්‍රචාරය වීමේ සිද්ධියට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය මෙහෙයවීමෙන් HRC/SUO/MOTU/13/26 අංකය යටතේ විමර්ශනයක් ආරම්භ කරන ලදි. ඊට අමතරව වින්දිත පුද්ගලයාගේ ඥාතීන් විසින් ද තවත් පැමිණිලි දෙකක් ඉදිරිපත් කර ඇත.

එම සිද්ධියට අදාළ විමර්ශන කටයුතු සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් පොලිස් ස්ථානය වෙත ගොස් අදාළ තොරතුරු ලබාගෙන ඇති අතර මියගිය පුද්ගලයාගේ ඥාතීන්ගේ නිවෙස් වලට ගොස් ප්‍රකාශ ලබාගෙන ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව මියයාම සම්බන්ධයෙන් මීට පෙර වාර්තා වූ පැමිණිලි අධ්‍යයනය කිරීමේදී එනම්, 2020 වර්ෂයේ ජනවාරි මස සිට 2025 වර්ෂයේ මාර්තු මස 31 දින දක්වා පොලිස් අත්අඩංගුවේදී මියයාම් 49ක් හා අත්අඩංගුවට ගැනීමෙන් පොලිසිය සමඟ ගැටුම් මඟින් මිය ගිය සංඛ්‍යාව 30ක් බවට අනාවරණය වී ඇත. මේ සම්බන්ධව බරපතල ලෙස අවධානය යොමු කළ කොමිෂන් සභාව අත්අඩංගුවට ගන්නා සැකකරුවන් සම්බන්ධව ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ සකස් කර පොලිස්පතිවරයා සමඟ ද සාකච්ඡා කර එම මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබ ඇති අතර පොලිස්පතිවරයා විසින් ද එම මාර්ගෝපදේශ චක්‍රලේඛයක් මඟින් සියළුම පොලිස් ස්ථාන වෙත යොමු කොට ඇත. දැනට කොමිෂන් සභාව විසින් හෝමාගම සිදුවීම සම්බන්ධව කරනු ලබන පරීක්ෂණයේදී එම මාර්ගෝපදේශ වලට අනුගතව අදාළ පොලිස් නිලධාරීන් ක්‍රියා කර නොමැති බව අනාවරණය වේ. තවදුරටත් මේ ආකාරයෙන් පුද්ගලයින් අත්අඩංගුවේදී මියයාම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව සිය දැඩි කනස්සල්ල ප්‍රකාශ කර සිටී. එමෙන්ම මෙම සිද්ධියට අදාළව පරීක්ෂණ කටයුතු සඳහා 2026.10.29 වන දින ප.ව.1.30 ට වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලෙසට සිතාසි නිකුත් කර ඇත.

මීට අමතරව මෙම මියගිය පුද්ගලයාගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කළ වෛද්‍යවරයාගෙන් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා කැඳවීමට තීරණය කර ඇත. අදාළ සියළු පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අවසන් තීරණය නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

නිහාල් චන්ද්‍රසිරි
මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

28.10.2026

දුරකථන අංකය : 011 2505595
විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com director.rm@hrcsl.lk